# නන්දන වීරසිංහයන් කාව්‍යකරණයෙහි ලා උපයුක්ත භාෂා ශෛලිය

මොරකන්දේගොඩ අරියවංස හිමි

## Abstract

Nandana Weerasinghe has a special place among the poets who are engaged in composing poetry in the Sinhala literary tradition. The uniqueness of Weerasinghe's poetic works is to inherit a poetic practice nourished by the Sinhala classical language. His poetry works such as **Kiri Suwadeti Ratriyak** (1991), **Satyakama Nam Wemi** (1995), **Giraga** (1998), **Mahat Sada Pini Bideka** (2002) and **Kshana Niyama** (2019) were awarded the 'State Literary Award' in the respective years which shows the uniqueness of his poetry. In addition to this, his works such as **Gingage Wilapaya** (1984), **Candra Bimba** (2005) and **Sahas Res Yata** (2011) also show the author's talent in poetry. The main purpose of this research article is to analyze the special features of the language used by Nandana Weerasinghe in his poems. Weerasinghe has a creative use of language that is inspired by classical literature and has very meaningful expressions. He showed a preference as well as a skill for the metaphor rather than the simile and the use of symbols rather than the conventional terms. The research problem here is to investigate what kind of language Weerasinghe has used in his poetry books. All the poetic works composed by him were studied in this research and the various language effects used in it were examined in depth. Thus, when we pay attention to all the poetic works of Weerasinghe, it is seen that there is a beautiful poetic language that gradually became superior. Sometimes he uses simple language and sometimes deep language in

his works. Accordingly, the poet spreads his authority to the intelligent reader as well as to the common reader. It is doubtful whether a writer has appeared in recent times who has worked so much with metaphors rather than similes. Starting with the poem ‘**Gingage Vilapaya**’ and ending with the last published collection of poetry ‘**Kshana Niyama**’, it is possible to see that the poetic language of the author has gradually become superior and standard.

**Keywords:-** Language usages, Metaphors, Poetics, Semantics, Symbols.

**සාරසංක්ෂේපය**

සිංහල කාව්‍ය සම්ප්‍රදාය මැනවින් හැඳින කාව්‍යකරණයේ යෙදෙන වර්තමාන කවීන් අතර නන්දන වීරසිංහයන්ට හිමි වනුයේ විශේෂ ස්ථානයකි. සිංහල සම්භාව්‍ය සාහිත්‍ය භාෂාවෙන් සුපෝෂිත කාව්‍ය ව්‍යවහාරයකට උරුමකම් කීම වීරසිංහයන්ගේ සුවිශේෂත්වය හා සුවිශිෂ්ටත්වය පෙන්වන්නකි. **කිරි සුවඳැති රාත්‍රියක්** (1991), **සත්‍යකාම නම් වෙමි** (1995), **ගිරග** (1998), **මහත් සඳ පිනි බිඳෙක** (2002), **රිය කරා ගමන** (2010) සහ **ක්ෂණ නියාම** (2019) යන පද්‍ය කාව්‍ය අදාළ වර්ෂයන්හි දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබීම ද ඔහුගේ නිර්මාණයන්හි ඇති අද්විතීයත්වය ප්‍රකට කරන්නකි. මීට අමතර ව **ගිංගගේ විලාපය** (1984), **චන්ද්‍ර බිම්බ** (2005) හා **සහස් රැස් යට** (2011) යන ග්‍රන්ථ ඔහුගේ කාව්‍ය ප්‍රතිභාව වෙසෙසින් ප්‍රකට කරයි. මේ පර්යේෂණ ලිපියේ මුඛ්‍ය අරමුණ වනුයේ නන්දන වීරසිංහයන් කාව්‍යකරණයෙහි ලා උපයුක්ත භාෂා ශෛලියෙහි සුවිශේෂතා විමර්ශනයට ලක් කිරීම යි. වීරසිංහයන් සතු ව නිර්මාණාත්මක වූත් සම්භාව්‍ය සාහිත්‍යාභාසයෙන් ප්‍රභාවිත වූත් අර්ථව්‍යක්තියෙන් පරිපූර්ණ වූත් සුලලිත වාගුක්තීන්ගෙන් රම්‍ය වූත් භාෂා ව්‍යවහාරයක් වෙයි. උපමාවට වඩා රූපකයටත් සාම්ප්‍රදායික යෙදුමට වඩා සංකේත භාවිතයටත් ඔහු රුචියක් මෙන් ම නෛපුණ්‍යයක් දැක්වී ය. වීරසිංහයන් ස්වකීය කාව්‍යකරණයේ දී කෙබඳු ආකාරයේ භාෂාවක් භාවිත කර ඇත්තේ දැයි විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වෙයි. ඔහු විසින් රචනා කරන

ලද, රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ කාව්‍ය කෘති මෙන් ම අවශේෂ සියලු කාව්‍ය ග්‍රන්ථ ද මෙකී පර්යේෂණයේ දී අධ්‍යයනයට ලක් කළ අතර එහි අන්තර්ගත විවිධ භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ ව ගැඹුරින් විමසා බැලිණි. මෙලෙස වීරසිංහයන්ගේ සමස්ත කාව්‍යාවලිය දෙස විමර්ශනාක්ෂිය යොමු කරන විට පෙනී යනුයේ ක්‍රමයෙන් උන්නතියට හා උත්කර්ෂයට ගිය ප්‍රතිභාපූර්ණත්වයෙන් සමලංකෘත කාව්‍යශෝභාවක් පවතින බව යි. විටෙක සරල සුගමභාවයේ ද තවත් විටෙක තත්සම බහුල ඕජෝගුණ සම්පන්න භාෂා ව්‍යවහාරයේ ද ස්පර්ශය ලබන කිවිවරයාණෝ අවිදග්ධ පාඨකයා මෙන් ම විදග්ධ පාඨකයා ද එක සේ තම ග්‍රහණයෙහි රඳවා ගනිති. උපමාවෙන් නො ව රූපකයෙන් මෙතරම් වැඩ ගත් කවියකු මෑත අවධියෙහි පහළ වී දැයි යන්න ද සැක සහිත ය. '**ගිංගඟේ විලාපය**' පද්‍ය සංග්‍රහයෙන් ඇරඹී '**ක්ෂණ නියාම**' කාව්‍ය සංග්‍රහයෙන් උත්තුංගත්වයට හා සමුත්කර්ෂයට පත් සැබෑ දේශජ කවිත්වයේ රුවගුණ හා සුවඳ නන්දනයන්ගේ කව් පොකුරක ගැබ් වන්නේ ම ය.

**යතුරු පදඃ-** අර්ථව්‍යක්තිය, කාව්‍යකරණය, භාෂාත්මක ප්‍රයෝග, රූපක, සංකේත

## හැඳින්වීම

සිංහල කවියේ වපසරිය මැනවින් හැඳින කාව්‍යකරණයේ යෙදෙන වර්තමාන කවීන් අතර නන්දන වීරසිංහයන්ට හිමි වනුයේ මුඛ්‍ය ස්ථානයකි. පැරණි සම්භාව්‍ය සාහිත්‍ය භාෂාවෙන් සුපෝෂිත කාව්‍ය ව්‍යවහාරයකට උරුමකම් කීම වීරසිංහයන්ගේ සුවිශේෂත්වය හා සුවිශිෂ්ටත්වය පෙන්වන්නකි. **කිරි සුවඳැති රාත්‍රියක්** (1991), **සත්‍යකාම නම් වෙමි** (1995), **ගිරග** (1998), **මහත් සඳ පිනි බිඳෙක** (2002), **රැය කරා ගමන** (2010) සහ **ක්ෂණ නියාම** (2019) යන පද්‍ය කාව්‍ය ග්‍රන්ථ උක්ත වර්ෂයන්හි දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබීම ද ඔහුගේ නිර්මාණයන්හි ඇති අද්විතීයත්වය ප්‍රකට කරන්නකි. මීට අමතර ව **ගිංගඟේ විලාපය** (1984), **චන්ද්‍ර බිම්බ** (2005) සහ **සහස් රැස් යට** (2011) යන කාව්‍ය ග්‍රන්ථ ඔහුගේ කාව්‍ය ප්‍රතිභාවට නිරතුරු දෙස් දෙයි. මේ ලිපියේ මුඛ්‍ය අරමුණ වනුයේ නන්දන වීරසිංහයන් කාව්‍යකරණයෙහි ලා උපයුක්ත භාෂා ශෛලියෙහි සුවිශේෂතා විමර්ශනයට ලක් කිරීම

යි. කාව්‍යකරණමය භාෂා භාවිතයේ දී චන්ද්‍රරත්න මානවසිංහයන්, සාගර පලන්සූරීන් තරම් සුඛනම්‍ය භාෂාවක් සිරි ගුනසිංහයන්, පරාක්‍රම කොඩිතුවක්කු සූරීන් තරම් ආධානග්‍රාහිත්වයෙන් තොර භාෂාවක් නොයෙදූයේ නමුත් වීරසිංහයන් සතු ව ද නිර්මාණාත්මක වූත් සම්භාව්‍ය සාහිත්‍යාභාසයෙන් ප්‍රභාවිත වූත් අර්ථව්‍යක්තියෙන් පරිපූර්ණ වූත් සුලලිත වාගුක්තීන්ගෙන් රම්‍ය වූත් භාෂා ව්‍යවහාරයක් විය. උපමාවට වඩා රූපකයටත් සාම්ප්‍රදායික යෙදුමට වඩා සංකේත භාවිතයටත් ඔහු රුචියක් මෙන් ම නෛපුණ්‍යයක් දැක්වී ය.

**පර්යේෂණ ගැටලුව**

නන්දන වීරසිංහයන් ස්වකීය කාව්‍යකරණයේ දී කෙබඳු ආකාරයේ භාෂාවක් භාවිත කර ඇත්තේ දැයි විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වෙයි.

**පර්යේෂණයේ අරමුණු**

මේ පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු වනුයේ නන්දන වීරසිංහ සූරීන් ස්වකීය පද්‍ය කෘතීන්හි දී විවිධාකාර භාෂා ශෛලීන් නිර්මාණාත්මක ව භාවිත කිරීම, තත් තත් ප්‍රස්තුතයන්හි ලා භාෂාත්මක ප්‍රයෝගයන් උපයුක්ත කොට ගැනීම හා කාව්‍යාත්මක බස්වහරට අනුගත ව ස්ව නිර්මාණයන් සිදු කර ඇති ආකාරය විමසා බැලීම ය.

**පර්යේෂණයේ සුවිශේෂත්වය**

නන්දන වීරසිංහ රාජ්‍ය සම්මානලාභී ප්‍රශස්ත ගණයේ කවියකු වුව ද ඔහුගේ නිර්මාණ කෙරෙහි පාඨක-විචාරක ලෝකයෙහි අවධානය යොමු ව ඇත්තේ අල්ප වශයෙනි. පොදුවේ ඔහුගේ නිර්මාණ ගැන යම් පමණක හෝ විචාරයක් සිදු ව ඇතත් කාව්‍යකරණය සඳහා උපයුක්ත භාෂා ශෛලිය ගැන ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදු කෙරී නැත. එම නිසා මෙවන් විවරණාත්මක ශාස්ත්‍රීය ලිපියක් ඔහුගේ ශාස්ත්‍ර සම්ප්‍රදානය ඇගයීමට හා විමර්ශනයට ඉතා වැදගත් ය.

**සාහිත්‍ය විමර්ශනය**

රාජ්‍ය සම්මානලාභී කර්තෘවරයකු වුව ද නන්දන වීරසිංහයන්ගේ නිර්මාණ පිළිබඳ ව අප සමාජයෙහි ඇත්තේ අල්ප වූ කතිකාවකි.

ඔහුගේ නිර්මාණ ගැන කිසිවකුගේ අවධානයක් මෙතෙක් ප්‍රමාණවත් ලෙස යොමු ව නැත. කතුවරයාගේ සමස්ත කාව්‍ය සම්ප්‍රදානය ඇගයීමට ලක් කෙරෙමින් උපහාර සංග්‍රහයක් සම්පාදනය වුව ද තවමත් එය මුද්‍රණද්වාරයෙන් පිට ව සමාජගත වූ බවක් නො පෙනේ.

2019 වර්ෂයේ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලද නන්දන වීරසිංහයන්ගේ '**ක්ෂණ නියාම**' කෘතිය පිළිබඳ අපරැක්කේ සිරි සුධම්ම හිමියන් විසින් අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලයේ 6 වෙනි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණට 2021. 12. 23 ඉදිරිපත් කරන ලද 'නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණවල ඓතිහාසික ප්‍රවාද පඨනයෙහිලා පශ්චාත් ව්‍යූහවාදී න්‍යායේ උපයෝගීතාව' නමැති පර්යේෂණ පත්‍රිකාවේ දී වීරසිංහයන්ගේ නිර්මාණ පිළිබඳ ව්‍යූහවාදී එළඹුමකින් කරුණු ඉදිරිපත් කරනු දැක ගත හැකි ය.

'ශූන්‍යතා සංකල්පය, සෙන් බුදුදහමේ දාර්ශනික චින්තාව හා නන්දන වීරසිංහගේ කාව්‍යමය ප්‍රතිභාව' යන මැයෙන් අපරැක්කේ සිරි සුධම්ම හිමියන් විසින් සම්පාදිත අමුද්‍රිත පර්යේෂණ ලිපියෙහි දී නන්දන වීරසිංහයන්ගේ කාව්‍යමය චින්තාව පිළිබඳ මහායාන බුදුදහමේ දාර්ශනික පක්ෂයක් ගැන සාකච්ඡා කෙරෙනු විනා ඔහුගේ කාව්‍ය ග්‍රන්ථයන්හි අන්තර්ගත භාෂාමය ව්‍යවහාරය ගැන තොරතුරු ඇතුළත් නො වේ.

විශ්වවිද්‍යාලයන්හි උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ නිබන්ධ වශයෙන් නම් එතුමාගේ නිර්මාණ විමර්ශනය කෙරෙහි යම් උනන්දුවක් පවතින බැව් දැකිය හැකි ය. එනමුත් ඔහුගේ භාෂා භාවිතයෙහි සුවිශේෂතා ගැන අවධානයක් යොමු කොට ඇත්තේ මඳ වශයෙනි.

රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයෙහි HS/2010/12770 අංක දරන උපාධි අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඉදිරිපත් කරන ලද 'නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්' නමැති අමුද්‍රිත පර්යේෂණ නිබන්ධයෙහි නන්දන වීරසිංහයන්ගේ පද්‍ය නිර්මාණයන්ගේ විවිධ අංශ නියෝජනය වන අයුරින් තොරතුරු අන්තර්ගත කර ඇත. එහි 5 වෙනි පරිච්ඡේදය වෙන් වී ඇත්තේ කාව්‍ය නිර්මාණවල භාෂා භාවිතය විග්‍රහ කිරීමට යි.

රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයෙහි HS/2015/15355 අංක දරන උපාධි අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඉදිරිපත් කරන ලද 'සිංහල නිසඳැස් කාව්‍යයෙහි සංකේත භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්' නමැති අමුද්‍රිත පර්යේෂණ නිබන්ධයෙහි නන්දන වීරසිංහයන්ගේ පද්‍ය නිර්මාණවල සංකේත භාවිත වූ ආකාරය ගැන තොරතුරු අන්තර්ගත වෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

නන්දන වීරසිංහයන් විසින් රචනා කරන ලද, රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ කාව්‍ය කෘති මෙන් ම අවශේෂ සියලු කාව්‍ය ග්‍රන්ථ ද මෙකී පර්යේෂණයේ දී අධ්‍යයනයට ලක් කළ අතර එහි අන්තර්ගත විවිධ භාෂාත්මක ප්‍රයෝග පිළිබඳ ව ගැඹුරින් විමසා බැලිණි. එකී භාෂා යෝජනයන් ඒ ඒ වර්ගීකරණයන් යටතේ සෝදාහරණ ව විවරණයට ද බඳුන් කෙරිණි.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

නන්දන වීරසිංහයන්ගේ භාෂා භාවිතය ගැන අවධානය යොමු කරන විට දක්නට ලැබෙන සුවිශේෂත්වයක් ලෙස අජීවත්වයට සජීවත්වය ආරෝපණය කිරීම හෙවත් උත්ප්‍රේක්ෂාලංකාරය වෙසෙසින් හඳුනා ගත හැකි ය. එවන් අවස්ථා ඔහුගේ පද්‍ය ග්‍රන්ථාවලිය මුළුල්ලෙහි ම දැකිය හැකි ය. '**කිරි සුවඳැති රාත්‍රියක්**' නම් ග්‍රන්ථයෙහි 'කඩුපත් බඳු අත්' නමැති පද්‍ය පන්තියෙහි මෙසේ සඳහන් වෙයි.

"දරු මුණුබුරන් වාගේ

දුක් කරදර වඩා ගෙන නළවන

නැති බැරිකම් ඇකයේ ඔබාගෙන" (**වීරසිංහ, 2011B:12**)

දෙමාපියාදීන් දරු මුණුබුරන් තමා වෙත ළං කර ගෙන නළවනුයේ අපරිමිත සෙනෙහසිනි; දයාවෙනි; අනුකම්පාවෙනි. මොවුන් දුක් කරදර ළං කර ගෙන ඇත්තේ ද එපරිද්දෙනි. දූදරුවන් උකුළතෙහි හොවා ගන්නාක් මෙන් නැති බැරිකම් ඇකයේ ඔබාගෙන ඇත. මෙය ප්‍රබල ව අර්ථ ජනනය කරන, ප්‍රකාශන ශක්තියෙන් අනූන

කාව්‍යෝක්තියකි. එසේ ම පහත දැක්වෙනුයේ '**කිරි සුවඳැති රාත්‍රියක්**' නම් ග්‍රන්ථයෙහි 'කියා සිටිමි ජනපදේට' නමැති පද්‍ය පන්තියෙන් උපුටා ගත් එවන් භාෂා යෝජනයකි.

"පපු පෝරණු තුළ ඇවුලුණු පාළු දෙකන්නයෙ ගිනිමැල" **(වීරසිංහ, 2011B:71)**

උක්ත පද්‍ය පන්තියෙහි අන්තර්ගත මේ ප්‍රකාශය ප්‍රබල ව අර්ථ ජනනය කරන්නකි. යල මහ දෙකන්නය විනාශ වී ගිය පසු ගොවියාගේ පපුව නමැති පෝරණුව තුළ ඇවිළෙනුයේ ගිනිමැළයක් විනා අන් කවරක් ද? මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ අග හිඟකම් නමැති සර්පයන් නැවත ද ගෙපැල වටා දරණ ගසා ගැනීම පමණි.

"ආයෙත් අග හිඟයෙ සපුන් ගෙපැල් වටා දරණ ගසන" **(වීරසිංහ, 2011B:71)**

"ලාභ සත්කාර මලපුඬුවල

පැටලී ධම්ම දායාද වැනසෙන" **(වීරසිංහ, 2011B:114-115)**

භික්ෂුවකගේ වටිනාකම රඳා පවතිනුයේ අධ්‍යාත්මික ගුණ ධර්මයන් පදනම් කොට ගෙන විනා ධනධාන්‍යමය ආඪ්‍යත්වය හෝ සමාජ ප්‍රභූත්වය මත හෝ නො වේ. ලාභ සත්කාර නමැති මලපුඬුවල පැටලුණු විට වැනසී යනුයේ ධර්මය නමැති දායාදයන් ය. රූපක භාවිතයෙන් ප්‍රබල ව අර්ථ ව්‍යක්තිය ඇති කළ අයුරු අපූර්ව ය.

රූපක භාවිතයට බොහෝ වර්තමාන රචකයන් අභිරුචියක් දක්වන නමුත් නව්‍ය රූපකයන් නිර්මාණය කරමින් ප්‍රබල ව ඉන් වැඩ ගත් කවියන් අතර නන්දන වීරසිංහයෝ සුවිශේෂ ස්ථානයක් උසුලති. ඔහුගේ එබඳු යෙදුම් කිහිපයකි පහත දැක්වෙනුයේ.

"රෝග කාරක ග්‍රීෂ්මයා

සිඹ හරින චණ්ඩ රශ්මී වැදී

දැන් මහ උණ ලෙඩෙකි පොළොව" **(වීරසිංහ, 2011B:188)**

රෝග කාරකයා වන ග්‍රීෂ්මයා වෙතින් පිට වනුයේ චණ්ඩ වූත් රෞද්‍ර වූත් රශ්මිය යි. එය වැදීමෙන් මහ පොළොව උණ ලෙඩකු බවට පත් ව ඇත. මෙය අපූර්ව වූ සංකල්පනයකි.

"මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන" (**වීරසිංහ**, 2011B:44)

පෙඟී ඉදිරියට නෙරා සායම් පොතු ගැලවී ඇති බිත්ති මාන්දම නමැති රෝගයෙන් පෙළෙන අයකුගේ ස්වරූපයෙන් දක්වා ඇත්තේ ඒ රෝගයෙන් පෙළෙන්නකු බඩ ඉදිරියට නෙරා දෙපාවල කොරපොතු මතු ව සිටිනු දැකීම සාමාන්‍ය දර්ශනය බැවිනි.

"වලව්වේ විය ගසින් මිදී රිසි සේ හාන" (**වීරසිංහ**, 2011B:44)

'වලව්වේ විය ගස' යන්න බලය සංකේන්ද්‍රගත වීමේ අනිෂ්ට විපාකයන්ගේ ස්වරූපය අතිශය ප්‍රබල සේ නිරූපණය කරන රූපකයකි. දුගී දුප්පත් මිනිසුන් වලව් පැලැන්තියේ වහලුන් බවට පත් ව වින්දා වූ අප්‍රමාණ දුක්ඛදෝමනස්සයන්ගේ ස්වරූපයත් ඉන් මිදීමෙන් ලත් සුඛසෝමනස්සමය ප්‍රහර්ෂයත් මින් කදිමට නිදර්ශිත ය.

"කොන්ත්‍රාත් අත්වලින් කෙට්ටු වුණු" (**වීරසිංහ**, 2011B:29)

ඉහත උද්ධෘතයෙන් පෙනෙනුයේ වර්තමාන කාර්මික ලෝකය පදනම් කොට ගත් සමහර සංකල්ප ද කලාත්මක ව තම කාව්‍යකරණයට ප්‍රවේශ කර ගැනීමෙහි ලා වීරසිංහයන් සතු ව පැවති දක්ෂතාව යි.

"වනපති තුරු වියන සිඳ

කෙලෙසා සුවය වන විහරණ

මේ ගිජු ලිහිණි සඳ

වැටෙයි අරහත් ධජය පා මුල" (**වීරසිංහ**, 2011B:114)

වනස්පති තුරු වියන වනසා සුවය නමැති වන අරණ කෙලෙසා මේ ගිජු ලිහිණියකු වූ උත්තමයා භික්ෂූන් වහන්සේ නමක

පාමුල වැඳ වැටෙයි. සැබවින් ම වර්තමාන සමාජයෙහි බොහෝ නායකයන්, ප්‍රභූවරුන් අතින් සැබෑවට ම සිදු වන්නේ ද මෙය යි. මෙහි සියලු යෙදුම් සෝපහාසයෙන් හා උත්ප්‍රාසයෙන් යුක්ත ව යොදා ඇති බැව් පෙනී යයි. කවියා සරල වචන කිහිපයක එකතුවකින් නිර්මාණය කරන අර්ථ සෞන්දර්යය වනාහි බෙහෙවින් ම ළගන්නා සුලු ය.

රූපකයට පමණක් නො ව කාව්‍ය ලෝකයෙහි පෘථුල ව ම භාවිතයට පැමිණි උපමා යෝජනයෙහි ලා ද වීරසිංහයෝ නව්‍යත්වයක් ප්‍රකට කරති.

"හිරු දෙවියා විලස අහසෙහි

යක්ෂයෙකි බුර බුරා ඇවිළෙන

ගං හෝ වැව් ද සත් වග

ගිනි ජල් ගසා දවනුව

රජයෙන් වැටුප් ලබනා

උමතු සෙබළකු බඳු ව" (වීරසිංහ, 2011B:188)

දේවත්වයෙන් සැලකූ සූර්යයා වනාහි ගං හෝ වැව් ද සත්ත්ව වර්ගයා ද ගින්නෙන් දවා ලීමට අහසෙහි බුර බුරා ඇවිළෙන යක්ෂයකු වැනි ය. ඔහු කෙතරම් කුරිරු ද යත් රජයෙන් වැටුප් ලබනා උමතු සෙබළකු බඳු ය. විටෙක රාජ්‍ය තන්ත්‍රය ද ස්වාභාවික පරිසරය ද යන දෙක ම අසරණ, අහිංසක මිනිසුන්ගේ කායචිත්ත පීඩාව පිණිස ම හේතු වනයුරු මෙයින් මනා කොට නිරූපණය කොට ඇත. 'කිරි සුවඳැති රාත්‍රියක්' කෘතියෙහි 'අලුත් උළු ගෙයි පළමු රාත්‍රිය' නමැති පද්‍ය පන්තියෙන් ගත් උදාහරණයක් පහත දැක්වෙයි.

"බලු වලිග බඳු බාල ලී ඇති" (වීරසිංහ, 2011B:29)

වර්තමාන වාණිජ ලෝකයේ විවිධ ප්‍රවාහයන්ට හසු ව ගසා ගෙන යන්නවුන්ගේ පරමාර්ථය වනුයේ කුමන හෝ මාර්ගයකින් යමක් උපයා ගැනීම විනා සමාජ හිතකාමී, සාධාරණ ක්‍රමවේදයකින්

ධනෝපාර්ජනය නො වේ. ඒ බැව් ඉහත උපමාවෙන් මැනවින් ම දක්වා ඇත.

අපූර්ව වූ භාෂාත්මක යෝජනයෙහි ද නව්‍ය සංකල්ප ජනනයෙහි ද පැවති සුවිශදභාවය ප්‍රකට වන පද්‍ය නිර්මාණ රාශියක් ඔහුගේ ග්‍රන්ථයන්හි එයි. ඉන් කිහිපයක් වෙත හෝ අවධානය යොමු නොකැරිණි නම් එය ඔහුට කැරෙන අසාධාරණයකැයි හැඟේ. '**සත්‍යකාම නම් වෙමි**' නම් වූ පද්‍ය නිර්මාණයෙන් උපුටා ගත් කොටසකි පහතින් දැක්වෙනුයේ.

"දුරුතු මස මිහිදුම් මෙන්

නැඟුණු වෙඩි දුම් කපාගෙන

බුරාගිය අජානෙය රථයක

දිනෙක මේ නෙත්

රත් යවට බැබැළිණි

රිහිරි සුවඳැති අඳුරට

ලිහා ලූ දඩ බලු කැලෙහි

ස්වාමියෙකි මේ උපාසක" (**වීරසිංහ, 2011B:113-114**)

සැබවින් ම සමාජයෙහි ඉතා ඉහළින් වැජඹෙන බොහෝ දෙනකුගේ සත්‍ය හා තථ්‍ය ස්වරූපය මෙහි මැනවින් නිරූපිත ව ඇත. උපාසක ලීලාවෙන් සිටියේ නමුදු අසරණ මිනිසුන්ගේ ජීවිතවලට විනාශය කැඳවූයේ ඔවුන් ම ය. සාමාන්‍ය සමාජයෙහි උපශාන්ත ලීලාවෙන් යුක්ත ව, නිවුණු ඉඳුරන් ඇති ව වසන්නේ නමුදු ඔවුන්ගේ යථා ස්වරූපය වනාහි මෙහි විද්‍යමාන අයුරු ම ය. මෙහි එන 'නෙත් රත් යවට, රිහිරි සුවඳැති අඳුර, ලිහා ලූ දඩ බලු' යනාදි යෙදුම් භාවිතයෙන් කවියා ඉතා දක්ෂ ලෙස හා ප්‍රබල ව භාෂාව හසුරුවා තම ප්‍රස්තුතය යථාවිධීන් නිරූපණය කොට ඇත.

සිංහල පද්‍ය කාව්‍ය භාෂාව සාමාන්‍යයෙන් ගත් කල මිශ්‍ර සිංහල ව්‍යවහාරයකට වඩා ශුද්ධ සිංහල ව්‍යවහාරයකට නැකම් කියයි.

සීගිරි ගීයෙන් පටන් ගෙන **සියබස්ලකර**, **මුවදෙව්දාවත**, **සසදාවත** හා **කව්සිළුමිණ** යන ග්‍රන්ථයන්ගෙන් වැඩී අවුත් සන්දේශ කාව්‍ය හා කෝට්ටේ පද්‍ය නිර්මාණයන්ගෙන් මටසිළුටු වූ හුදු හෙළ බස හෙවත් නුමුසු හෙළ බස පිළිබඳ විමර්ශනාක්ෂිය යොමු කිරීමෙන් ඒ බැව් පැහැදිලි වෙයි. එහෙත් වර්තමානය වන විට අමිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරය ද කාව්‍යකරණයෙහි දී භාවිත වනු දැකිය හැකි ය. අන්‍ය කර්තෘවරුන්ට වඩා වැඩි ප්‍රවණතාවකින් මිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරය අමිශ්‍ර සිංහලය හා මුසු කොට තම කාව්‍යකරණයට යොදා ගනුයේ නන්දන වීරසිංහයන් ය. පහත දැක්වෙනුයේ එබඳු ව්‍යවහාර කිහිපයකි.

'**පස්වණක් කවි ලකුණු**' ග්‍රන්ථයේ අන්තර්ගත 'භාවනාවෙහි (**වීරසිංහ, 2011B:60**), පරිණාම ලතාවේ, චණ්ඩ පක්ෂියා (**එම. 61**)., මාංශය (**එම. 62**)., අනිත්‍යය (**එම. 63**)., මන්ද්‍ර ස්වරයෙන, ශුද්ධ ධ්වනි (**එම. 94**)., සන්තාපයේ, සංවේගයේ, ලෝකාධිපතියෝ (**එම. 97**)., ශූන්‍යාගාරයෙහි (**එම. 100**)., විස්මයාවහ යන්ත්‍රයක (**එම. 110**)., අනන්තාපරිමාණ (**එම. 139**)., මෘග සංඥාව (**එම. 140**)., සයනාසනයකින් (**එම. 166**)., භද්‍ර යෞවනයෙන් විරාජිත, අරුණෝද්ගමන (**එම. 166**)., අසංඛ්‍ය, මධුර ධ්වනියකි (**එම 283**)., ආශ්චර්යයක්, අද්භූතයක්' (**එම. 285**). යන වචන ද '**චන්ද්‍ර බිම්බ**' ග්‍රන්ථයේ දැක්වෙන 'ප්‍රතිබිම්බ, පුරා පුරුෂ ප්‍රතිරූප (**වීරසිංහ, 2005:14**), නදී ඝෝෂය, ධාරාපතන, පෝෂිත (**එම. 20**)., විනෝද මණ්ඩප (**එම. 25**)., ධවල පර්වත, අන්තර්ධාන (**එම. 33**)., ශෝකාන්ත (**එම. 36**)., ගවේෂක (**එම. 37**)., නිරුත්සාහක (**එම. 40**)., මහා ආසන දේව මන්දිර, ශුද්ධ ග්‍රන්ථ, නිශ්චල (**එම. 41**)., අප්‍රමාද (**එම. 42**)., වස්සානයේ යෞවනෝදෙන්, ධවල ඡායා (**එම 43**)., අර්හත් ධජය, ස්වර්ණ වර්ණ, ගිම්හාන තාපයෙන් (**එම. 44**)., මේඝ දූතයාණන් (**එම. 46**)., අකම්පිත (**එම. 47**)., අවකාශයට (**එම. 54**)., පාෂාණකාය (**එම. 55**)., ප්‍රාදුර්භූතය' (**එම. 47**). යන පද ද '**ක්ෂණ නියාම**' පද්‍ය සංග්‍රහයේ ඇති 'ආකාශ පුරයෙක, දිව්‍ය රූපය (**වීරසිංහ, 2019:14**), පරිභෝග, පාංශුකූලික චීවරය (**එම. 15**)., පර්වත, ඖරස පුත්‍ර, ඡායා පතිත (**එම. 16**)., පුරුෂ අංකුස, උන්මාද, රමණයෙහි රමණය, මදනෝත්සවයක (**එම. 17**)., ශූන්‍යාගාරයෙකි (**එම. 18**)., දුෂ්කර ක්‍රියාවෙහි, දර්ශනමාත්‍රය (**එම. 23**)., ආශ්චර්යය (**එම. 24**)., ජන්මයක් (**එම. 25**)., රූපාවලී (**එම. 35**)., ආකාශගත, ස්වර්ගීය (**එම. 59**)., ශාක්‍ය කුලයෙන්, ශ්‍රමණයාණන් (**එම. 69**)., ඛ්‍යාම

ප්‍රභා කේතුමාලා රංසිමාලාදි (එම. 70)., අනේක ස්වර, උච්චය' (එම. 77). යන පද ද මේ සඳහා උදාහරණ සේ දැක්විය හැකි ය. ඉහත දැක්වූයේ වීරසිංහයන් තම කාව්‍ය සංග්‍රහයන්හි දක්වා ඇති මිශ්‍ර සිංහල පද මාලාවන්ගෙන් ස්වල්පයක් පමණි. කෙසේ නමුත් මුල් අවධියෙහි ස්වකීය පද්‍ය පන්තීන්හි දක්නට ලැබුණු මිශ්‍ර සිංහල පදවලට වඩා වැඩි සංඛ්‍යාවක් පසුකාලීන ව පළ වූ ඔහුගේ ග්‍රන්ථයන්හි (විශේෂයෙන් 2019 දී පළ වූ '**ක්ෂණ නියාම**' ග්‍රන්ථයේ) දක්නට ලැබේ. ඉන් ගම්‍ය වනුයේ කාව්‍යය සම්බන්ධ පරිණතභාවය වැඩි වත් වැඩි වත් ම භාෂාත්මක ව පැවති සරල, සුගමභාවය කෙමෙන් කෙමෙන් ඈත් ව ගොස් අර්ථ ව්‍යක්තියෙන් අනූන, ඖදාර්ය ගුණ බහුල භාෂාවකට සංක්‍රමණය වූ ආකාරයකි. එහෙත් වඩා යෝග්‍ය හා සම්මානිත වනුයේ එහි ප්‍රතිවිරුද්ධ දිශානතිය වෙත සමීප වූවා නම් ය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් සොළොස් වියේ දී රචනා කරන ලද **පරෙවි සන්දේශයේ** භාෂාව ඕලාරික හා අසංයත ස්වරූපයක් ගත් අතර කාව්‍යකරණමය පරිණතභාවයෙන් යුක්ත අවධියෙහි රචිත **සැළලිහිණි සන්දේශයේ** භාෂාව සරල, සුගම හා ඖචිත්‍ය ගුණයෙන් පරිපූර්ණ සුබනම්‍ය ස්වරූපයක් ගෙන ඇත.

මිශ්‍ර සිංහල පද කිහිපයක් පමණක් නො ව මුළු පද්‍ය පන්තිය ම පාහේ මිශ්‍ර සිංහල පදයන්ගෙන් බහුල ව රචනා වුණු පද්‍ය නිර්මාණ ද සමහර විටෙක හමු වේ. '**ක්ෂණ නියාම**' කෘතියෙහි එන 'සංචාරක මිතුරා අබියස' යන පද්‍ය පන්තිය එවැන්නකි.

"මහාද්වීප සිතියම්

උස් බිතු අරා නිද්‍රාවෙන්

පසු වන මැද සාලය ය

දේශාන්තර ගෙවමින්

කළ චාරිකා සියලු ම

සමරූ පින්තූර පොත් ලෙස

ගනීභූත ව හැම තැන...

අනගි සිහිවටන ඔහු මුවගින්

හැරෙයි ඉතිහාසයකට

භූගෝල විද්‍යාවට

'තියන්මෙන්' ගිරි දුර්ගයෙ

ආකාශගත වටවංගුවල...

අනන්තාපරිමාණ

'ස්විච්බැක්' තැනිතලාවේ

දෙවඟනුන් සේ ඈතින්

ධවල ඡායා සේ දිසෙන" (**වීරසිංහ, 2019:67-68**)

මෙහි අන්තර්ගත සංස්කෘත තත්සම ශබ්ද තරමක් කයෝර වීම හේතු කොට ගෙන පද්‍යයේ ගලා යාම යම් පමණකට අඩාල වූයේ නමුත් කවියා ඒවා නිසි තැන නිසි අයුරින් යෙදීමෙහි ලා භාෂාත්මක පටුත්වයක් නම් පෙන්වා ඇත.

තම කාව්‍ය ප්‍රතිභාව මුහුකුරා යත් ම භාෂාවේ යම් පමණක තත්සම පද බාහුල්‍යය නිසා ගම්භීරතාවක් ඇති වූයේ නමුදු සමහර පද්‍ය පන්තියක මතු වන සරල, සුගම භාෂා ශෛලිය අපූර්වත්වයක් උසුලයි. '**ක්ෂණ නියාම**' ග්‍රන්ථයෙහි 'බුදුන් දැකීම' නම් පද්‍ය පන්තියෙන් උපුටා ගත් කොටසකි පහත දැක්වෙනුයේ.

"ඒ දුම් සුවඳ යැ යි

සෙල් රුවට නැත

හැඟුමක්

මේ සුගතිඳු ගෙ දසුනැ යි

දුම් කඳට නැත

නුවණක්" (**වීරසිංහ, 2019:11**)

මෙහි ඇති භාෂාත්මක සරලත්වයත් එහෙත් ඒ හා බැඳුණු අර්ථ ගාම්භීර්යයත් අතිශය පරිණතභාවයකින් යුක්ත කවියකු වෙතින් විනා ආධුනික අංකුර ප්‍රබන්ධකරුවකු අතින් මතු ව එන්නක් නො වේ.

බොහෝ නූතන කවීන් පැරණි සම්භාව්‍ය සාහිත්‍යාගත භාෂාවෙහි ආභාසය ලැබීමෙහි ලා පළට කරනුයේ ධනාත්මක ප්‍රවණතාවක් නො වේ. එක්කෝ ඔවුහු එකී භාෂාව නො දනිති; නැතහොත් නො තකා හරිති. එහෙත් වීරසිංහ සූරීහු සම්භාව්‍ය සාහිත්‍යාත්මක යෙදුම් ඇසුරු කිරීමෙන් තම කාව්‍ය භාෂාව ඔපවත් කර ගැනීමෙහි ලා දක්වනුයේ අපූර්ව වූ කෞශල්‍යයකි. සරච්චන්ද්‍රයන්ට තරම් එකී ශක්තිය නෛසර්ගික ව මෙන් මොහු වෙත නොපිහිටියේ නමුදු එහි ලා වීරසිංහයන් සතු වූ ශක්තිය ද ලඝු තන්හි ලා නොතැකිය යුත්තේ වේ. මේ එවන් යෙදුම් කිහිපයකි.

"අවරගිරි නැටියෙන් වැටෙන

දුක්බරිත රිවි මුහුණ" (**වීරසිංහ, 2011B:408**)

"අග පිපි මලින් වැහෙන

රොනින් ආකුල ඉවුර'ස

නන් සිහින් පත් සිහිලැති" (**වීරසිංහ, 2019:71**)

"අග පිපි මල් කලඹ ගෙන" (**වීරසිංහ, 2011B:82**)

"දෙව්ලොව සිරි'රුපෑ" (**වීරසිංහ, 2005:49**)

මේවා **සැලළිහිණිය** ආදි කොට ඇති සන්දේශයන්හි එන පද්‍යයන්ගේ ආභාසයෙන් රචනා වී ඇති බැව් හැඟී යයි.

"රස පොළොව විඳුනා මෙන්" (**වීරසිංහ, 2011B:409**)

"මහ ගිනි ඇවිළගත් සැන්දැග

ඒ රත වතළ ඇගෙ

දිගු නෙත්" (**වීරසිංහ, 2019:49**)

"තනහස් සොයා අතැඟිලි දිව යත" (**වීරසිංහ, 2019:50**)

"බමර පියරුවු ඇති

පුල් පියුම් ගත් අතුපතර" (**වීරසිංහ, 2019:40**)

"අතුරුවා සිය බඳ මත

උණුසුම් සුසුම් වෙයැති ව

වත දෙතොල සිපගනිත,

මුළු ඇඟ හිවුඩු නැඟ" (**වීරසිංහ, 2019:32**)

මේවා **කව්සිළුමිණි** ගීවල ආභාසයෙන් ලියැවී ඇති සෙයක් පෙනේ.

"පුර යෝනන් දුහුළු සළු විනිවිද" (**වීරසිංහ, 2011B:409**)

යන්න **මුවදෙව්දාවත** භාෂාවෙහි ආභාසයෙන් ලියැවුණකැයි හැඟේ.

සීගිරි ගීයෙහි රුව ගුණ ද ස්වකීය පද්‍ය නිර්මාණයන්හි රුවා ලන්නට විටෙක නන්දනයෝ වෙර දරති. '**ක්ෂණ නියාම**' ග්‍රන්ථයෙහි එන 'දුටුවො සිහිගිරි' නමැති පද්‍ය පන්තිය මෙබන්දකි.

"ගිරිබිතැ හද බිඳින ලිය පියොවුරු සොබන

කැඳවත, බලා ඇඳි පිළි ලිහිලැති කතුන

කුළ මත රහස දුටුවෝ නිසි මඟ ගොසින

මුදුනත රහස මුදුනෙහි නො දුටු ව පමණ" (**වීරසිංහ, 2019:46**)

"ළා දෙතොල් සහසක් ය

ඉන් පසු එහි ගිහිණි

මල් පෙති පවා පැරැයූ

පත් කලබ" (**වීරසිංහ, 2019:47**)

මෙහි දක්නට ලැබෙන භාෂාව ද බොහෝ දුරට සීගිරි ගී භාෂාවට නෑකම් දක්වයි.

වීරසිංහයන් තම පද්‍ය නිර්මාණයන්හි ලා නිබඳ ව හා බහුල ව භාවිත කරන ක්‍රියා ප්‍රයෝගයක් සේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව හඳුන්වා දිය හැකි ය.

'චන්ද්‍ර බිම්බ' පද්‍ය සංග්‍රහයෙහි 'බලත (**වීරසිංහ, 2005:9**), (**එම. 12**), දක්වත (**එම. 11**)., පවසත (**එම. 16**)., නැගෙත (**එම. 27**)., හැසිරෙත (**එම. 50**)., මුහුකුරා යත' (**එම. 51**). යන පද ද '**ක්ෂණ නියාම**' කෘතියෙහි 'විමසත (**වීරසිංහ, 2019:30**), සිපගනිත (**එම. 32**)., හෙත (**එම. 40**)., නැගෙත (**එම. 41**)., පැටලෙත (**එම. 42**)., යත, එත, කැඳවත (**එම. 46**)., දිව යත (**එම. 50**)., ගෙන එත (**එම. 60**)., බලත (**එම. 81**)., මුමුනත (**එම. 85**)., රැගෙන යත' (**එම. 85**) යන පද ද හමු වේ.

තම කෘතීන්හි බහුල ව භාවිත සන්ධි ප්‍රයෝගයක් ද සියුම් ව විමසුම් ඇස හෙළන විට අපට හඳුනා ගත හැකි ය. එනම් 'අ' යන්න පූර්ව හා අපර වර්ණයන් සේ යෙදෙන පරස්වර ලෝප සන්ධිය යි. අන්‍ය සන්ධි පද ද ස්වකීය පද්‍ය ග්‍රන්ථවල භාවිත නමුත් මෙකී පද බහුල ව ම යොදනු පෙනී යයි. එවන් පද රාශියක් උපුටා දැක්විය හැකි නමුත් කිහිපයක් පමණක් මෙහි දැක්වේ.

'**චන්ද්‍ර බිම්බ**' නම් පද්‍ය සංග්‍රහයේ 'හැම'ත (**වීරසිංහ, 2005:9**), සිටින'තර (**එම. 14**)., ගන'ඳුරු (**එම. 19**)., තුඩ'ගින් (**එම. 23**)., පවසන'යුරු (**එම. 27**)., දිලිසෙන'යුරු (**එම. 29**)., උදය'ග (**එම. 31**)., ගිය'යුරු, ගන'ඳුරින්, බහල'ඳුරු (**එම. 39**)., ගන'ඳුරට (**එම. 43**)., පතිතවන'යුරු (**එම. 48**)., යන'තර, බහල'ඳුරෙහි, පෙර'ඩ' (**එම. 50**) යන පද ද '**ක්ෂණ නියාම**' කාව්‍යයේ 'වඩින'තර (**වීරසිංහ, 2019:15**), යන'යුර (**එම. 19**)., සිටින'යුරු (**එම. 21**)., යෙදෙන'තර (**එම. 23**)., පෙර'ඹරට (**එම. 27**)., බැඳුණ'යුර, තැවුණ'යුර (**එම. 32**)., කිරිසයුර'තින්, පවුර'තින් (**එම. 34**)., මඳ'ඳුර (**එම. 49**)., මුව'ගින්' (**එම. 67**) යන පද ද දැක ගත හැකි ය.

තද්ධිත පද බහුල කාව්‍ය නිර්මාණ සුලභ නොවන අතර ඔහුගේ කෘතීන්හි එසේ සකසා ගත් තද්ධිත පද සහිත භාෂාවක් අතරින්

පතර දැක ගත හැකි ය. විශේෂයෙන් 'ඉ' තද්ධිත ප්‍රත්‍යයය මෙහි ලා බෙහෙවින් උපයුක්ත ය.

'ඉසියුම් (වීරසිංහ, 2005:20)., (වීරසිංහ, 2011:281) ඉගැඹුරු (එම. 403). (වීරසිංහ, 2005:34) ඉගැඹරෙහි' (එම. 18) යන පද උදාහරණ සේ ගත හැකි ය.

ආරියවංශ රණවීරයන් හා නන්දන වීරසිංහයන් එක් ව රචනා කළ '**තුන්පෙති හතර පස් පෙති**' පද්‍ය සංග්‍රහයෙහි දක්නට ලැබෙනුයේ හයිකු සම්ප්‍රදායයේ කවි ය. පද කිහිපයක් භාවිතයෙන් අර්ථ ව්‍යක්තියෙන් අනූන පද්‍ය නිර්මාණයෙහි ලා ඔවුන් මෙහි දී පෙන්වා ඇත්තේ සුවිශද දක්ෂතාවකි.

කොකා යන සංකල්පය සිංහල සාහිත්‍යයෙහි හා ජන සමාජයෙහි විවිධ අයුරින් අර්ථ ගැන්වේ. බෙහෙවින් ම එහි ඇත්තේ ඍණාත්මක හෙවත් නිෂේධාත්මක අර්ථයකි. එකී ඍණාත්මක සංකල්පයට බොහෝ දුරට බක ජාතකය වැන්නකින් ආභාසය ලැබෙන්නට ඇත. එසේ ම බකතපස් වැනි ගැමි යෙදුමකින් ද එය තව දුරටත් තීව්‍ර කෙරේ. සුදු පැහැයෙන් යුක්ත වූයේ කොකාගේ තථ්‍ය ස්වරූපය වෙනස් නො වේ. ඌ තමාට ඉඩක් ලද පළමු මොහොතේ ම තම වංචනික අරමුණ සාක්ෂාත් කර ගනු ඇත.

"මේ සුදු හැඳි කොකුන්

පා මාරු කරන්නෙත්

සංවර ව" (**වීරසිංහ හා රණවීර, 2014:36**)

"වැව ළඟ බුදුරුවට මුවා වන

මසකු ගිලගත්

කොක් රුව" (**වීරසිංහ හා රණවීර, 2014:45**)

ඉහත කී තත්ත්වයන් මැනවින් ග්‍රහණය කර ගෙන රචකයා පද කිහිපයක් ආශ්‍රයයෙන් ව්‍යක්ත ව හා නිර්මාණාත්මක ව ඉහත හයිකු කවි දෙක ඉදිරිපත් කර ඇත.

"මඩ පැහැති

සිඟිති බිම්මල

සිය හිසෙහි

සිහින් වැලි කුඩු

තවරගෙන

අන් හැම මලකට ම

වැඩියෙන්

තම මුල කියයි

නිහඬ ව" (**වීරසිංහ, 2011B:332)**

මුල අමතක කිරීම හෙවත් අකෘතඥභාවය මිනිස් සමාජයෙහි බොහෝ දෙනකුන් වෙතින් නිබඳ ව, නිරන්තර ව සිදුවන්නකි. ඉතා කුඩා පද කැටියකින් අතිශය ප්‍රබල ව තත් සංකල්පය හුවා දැක්වීමට කවියා සමත් ව ඇත. පොළොවෙහි ජනිත ව, එහි ම වැඩී කෙටි කලකින් මිලාන වී යන බිම්මල තම හිස මුදුනෙහි පස් ස්වල්පයක් රඳවා ගනිමින් කියා සිටිනුයේ ඉහළට මතු වී සිටියේ නමුත් තමා ද මේ පොළොවෙන් උපන් අයකුය යන අදහස යි. එහෙත් මේ සමාජයෙහි බොහෝ දෙනකුට මෙය තේරුම් ගැනීම අපහසු ව ඇත; නැතහොත් තේරුම් ගැනීමට අවශ්‍ය නැත; එසේත් නැතහොත් තේරුම් ගැනීම හිතා මතා මඟ හැර ඇත.

## නන්දනයන් බහුල ව භාවිත කළ ප්‍රයෝගයක්

නන්දන වීරසිංහයන්ගේ සමස්ත කාව්‍යාවලිය පුරා හුයක් සේ පැතිර පවතින ප්‍රබල ම සංකේතය හෝ සංකල්පය වනුයේ කන්ද හෙවත් පර්වතය යි. 'ගිරග' යන නාමයෙන් ම පද්‍ය ග්‍රන්ථයක් ඇති අතර එහි පමණක් නො ව අන් සැම පද්‍ය නිර්මාණයක ම නිබඳ ව ම යෙදෙන්නකි මේ සංකල්පය. කුමන හේතුවක් මත එසේ වූයේ දැයි සෙවීමට වඩා එය යෙදී ඇති ආකාරය ගැන අධ්‍යයනය කිරීම වඩා යෝග්‍ය සේ හැඟේ.

කන්ද හෙවත් පර්වතය රූපකයක් සේ යෙදී ඇති ස්ථාන රාශියකි. තමාගේ කාව්‍ය ප්‍රබන්ධ වඩාත් ව්‍යක්ත ව, ප්‍රශස්ත ව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා කවියා 'කන්ද' රූපකයක් සේ යෙදූ එවන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

'**පස්වණක් කවි ලකුණු**' ග්‍රන්ථයෙහි සංගෘහිත 'කිරි සුවඳැති රාත්‍රිය' පද්‍ය කෘතියෙහි

"මහා ගල් කඳු ළය" (**වීරසිංහ, 2011B**:17), "ඈත කඳු තුඩු දියව" (**එම. 66**)., "මූකලන් කඳු තුඬ සමීපේ" (**එම. 67**)., "බැත කඳු හඳ දියේ පෙඟී" (**එම. 71**) යන උද්ධෘත ද

එහි ම එන 'සත්‍යකාම නම් වෙමි' නම් පද්‍ය කෘතියෙහි

"ගෙවී ගිය සොහොන් කඳු මිස" (**වීරසිංහ, 2011B**:82)., "ප්‍රඥා ගිරග රඳනා" (**එම. 124**)., "ජය ගිරග තරණට" (**එම. 186**)., "ප්‍රඥා ගිරග නැඟි - ධීර ජනයා සිහි කර" (**එම. 207**). යන උද්ධෘත ද දැක ගත හැකි ය.

රූපකයක් ලෙස පමණක් නො ව උපමා වශයෙන් ද පර්වත යොදා ගත් අවස්ථා රාශියක් දක්නට ලැබේ. මේ එවන් අවස්ථා කිහිපයකි.

"පර්වත ඡායා විලස" (**වීරසිංහ, 2011B**:234)

"උස් නූස් කඳු

අමතක ව ගියාක් මෙන්

ගිර හිඳියි" (**වීරසිංහ, 2011B**:242)

"ඒ සිහින සේයා බඳු කඳු ඇසුරෙහි" (**වීරසිංහ, 2011B**:371)

"අඳුන් කුළ සේ ඉන් නැඟී ගෙන" (**වීරසිංහ, 2005**:30)

"මා සොයා ගිය

තුඟු කන්ද විය

නුදුරු කඳුවැටි

අතර සම ලෙස" (**වීරසිංහ, 2011B:351**)

"'තියන්මෙන්' ගිරි දුර්ගයෙ...

ධවල ඡායා සේ දිසෙන

හිමාල කඳු මුදුන් දැක ගත කළ" (**වීරසිංහ, 2019:67-68**)

මීට අමතර ව ඔහුගේ ග්‍රන්ථයන්හි විවිධ ස්ථානවල විවිධ ආකාරයෙන් පර්වත හා කඳු ගැන සඳහන් ව ඇත. එවන් ස්ථාන අධික විස්තරයකින් තොර ව පහත දක්වනුයේ ඒ ගැන විමර්ශනය කරන්නකුගේ පහසුව තකා ය.

'**පස්වණක් කවි ලකුණු**' නමැති කෘති සමුච්චයෙහි

"ගල් ඇඳි නෙරා ආ බැවුම්" (**වීරසිංහ, 2011B:11**), "මහබෝගී පස්කඳු පිනවා" (**එම. 23**)., "කඳු අඩවියට පිට දී" (**එම. 25**)., "පිරිවරා බතල කඳු" (**එම. 55**)., "මහා ගල් කුළු සහිත - කඳු පාද වැලැඳ ගයි" (**එම. 65**)., "සැදුණු ගල් ගිරි මතෙහි" (**එම. 65**)., "ගිරි මුදුන් වලාකුළු", "නමුදු කඳු පා දැඩි ව" (**එම. 66**)., "සියක් කඳුරැලි මතින් පැන නැඟ" (**එම. 68**)., "කඳුකර නිදහස් පවන ද" (**එම. 73**)., "ප්‍රතාපවත් ගිරි මුදුන්" (**එම. 75**)., "වන දුර්ග, ගිරි දුර්ග මඟ මිස", "මේ ගිරි දුර්ගයෙහි" (**එම. 76**)., "මූකලන් කඳු බිම් මත" (**එම. 94**)., "ගිරි මුදුන් නිවී සැනැහී" (**එම. 96**)., "දිගාවෙමි ගල් - ගිරි මුඳුන් අතරේ" (**එම. 101**)., "පර්වත බිතු නැඟුණු" (**එම. 102**)., "දුර කඳු මුඳුන් මතුපිට" (**එම. 105**)., "පර්වත පාදයෙහි" (**එම. 113**)., "නුදුරු කඳු මුදුනක" (**එම. 122**)., "කඳු පා තෙමා ගෙන", "හූ තියා නැඟී කඳු බිම" (**එම. 127**)., "නුදුරු පර්වත පාදයෙහි" (**එම. 163**)., "ගලා යයි කඳු අතර" (**එම. 172**)., "සියලු වනගිරි - ජල දුදුළු දැක නො බා" (**එම. 205**)., "ගිරි මුදුන් මත පා ගසා" (**එම. 206**)., "සැදුණු ගල් ඇඳි පාමුල" (**එම. 207**)., "වර්ෂා වන සොඳුර කඳු මුඳුන් වලඳින" (**එම. 208**)., "කෙමෙන් උස් වී යන - මූකළන් කඳු බිම නැඟ" (**එම. 222**)., "ගිරි මුදුන වෙත වැටුණු" (**එම. 223**)., "වන ගිරි අතරේ"

(එම. 224)., "සරු මියුරුතම - ගිරිහිස", "ගිරිකුළ ද - එහි නැඟෙන - හිණි පෙළ ද" (එම. 227)., "රන් එළිය ගලා ගන වූ ගිරි මුඳුන්" (එම. 228)., "අවදි වී නැගී පෙරගිර" (එම. 232)., "මහා ගිර තරනට" (එම. 233)., "අඳුරු දුර්ගය පා මුල" (එම. 234)., "පර්වත පාදයෙහි - මේ සාප ලත් - බිම්කඩ" (එම. 235)., "ගිරි මුඳුන - නැග බලත" (එම. 238)., "මේ ගිර - අනෙක ගිරි පවුරු මැද" (එම. 239)., "උදාරම් ගිරි ශිඛර - පර්වත - මහා කඳු ප්‍රාකාර" (එම. 240)., "ගිර පෙනෙයි... පරිවාර කඳු අතරින්", "උස් නූස් කඳු" (එම. 242)., "නිල් ගිරග නැඟෙනුව - සැණ පැන නැඟී ගිරගට", "ගිර පා මුලට ළං වෙත" (එම. 246)., "නිල් ගිරි පාද මූලය", "ගිරි මුඳුනත - දිව්‍යමය රාත්‍රිය", "ගිරග පැති බිතුවල - ගිරි මුඳුන අතුවල" (එම. 247)., "නැගුණු සුමිතුරු - කඳුවැටි" (එම. 252)., "තුමුල රමණීය ගිරි හිස්", "දොම්නසින් බර - කඳුවැටි" (එම. 253)., "උත්තුංග - කඳු මඬුලු ඇසුරෙහි" (එම. 254)., "යුගළ පර්වත අතර" (එම. 255)., "තපෝ බිම වට ගිරි මුදුන්" (එම. 256)., "නො එක කඳුකර අවන්හල්වල" (එම. 256)., "එදා නැරඹූ ගිරි මුඳුන්" (එම. 256)., "පෙර අපි මේ ගිරග නැග... පහළ මිටි කඳු අතරෙහි... (එම. 259)., "ඒ මූකළන් ගිරගට" (එම. 260)., "කෙළෙස් කුළු වැටියෙහි" (එම. 262)., "ගිරිකුළකි එළදෙනකි... එළදෙන ද ගිරට වැඩි..." (එම. 263)., "එ නිසාය ගිරට වැඩි සුවිසාල එළදෙනක්..." (එම. 264)., "ගිරක් මෙන් අභිරමණීය ගලක් මත නැගූ මහ ගල් කුළකි... දැදුරු ගිරි පවුරු මැද... උගුලක් නො වූ සෙල්කුළ" (එම. 269-70)., "නොකිලිටි ම කඳු අතර" (එම. 271)., "මරු නිතර - අදිසි ව වෙසෙන - ප්‍රපාතය" (එම. 272)., " බිහිසුණු ම - පර්වත ප්‍රාන්තය" (එම. 272)., "මහා කඳු වැටි... මතු වුණු තුමුල ගිරි හිස් පෙනෙන්නේ" (එම. 277)., "මහ කඳු බඳෙහි... කන්දෙහි උසට - තවත් දැඟුලක්" (එම. 278)., "උස ම උස - කන්ද යැයි - උස් කන්ද ළඟ... ඒ අඳුන් ගිර පා මුල - කුඩු කන්ද යැයි" (එම. 279-80)., "පසු කළ වංකගිරි" (එම. 291).,

"තමා අංශුවක් මිස

කන්දකැ යි සිතා ගැන්මේ

විපාකය එබඳු ය" (එම. 117).,

"තව උදාරම්

ගිරි ශිඛර

මා නැඟි ගිරග පරයා

නුදුරු කඳුවැටි පළා" (එම. 238).,

"එක් ගිරි කුළක් නැග ජයගෙන පැමිණි දින...

කෙමෙන් පිළිවෙළින් තව උස් ගිරි නැගෙත

කුළින් කුළට නැඟි පමණට වී විපත...

අවසන් ගිරට නැග එන හෙට සැඳෑ අග" (එම. 292). යන උදාහරණ දක්නට ඇත.

'**පස්වණක් කවි ලකුණු**' නමැති කෘති සමුච්චයෙහි 'මහත් සඳ පිනි බිඳෙක' නම් ග්‍රන්ථයෙහි ස්ථාන රසක ද කඳු පර්වත ගැන සඳහන් වෙයි.

"අර මුඩු - කඳු මුදුන්වල - කුරුළු ගී - නිම් නැත" (**වීරසිංහ, 2011B**:297) "මහ කඳු වැටි - සැඟැවී ගිය" (**එම. 300**)., "වලා පෙළක් - නිති වෙහෙසෙයි - කඳු මඬුලු මවා - රිසි සේ" (**එම. 301**)., "පර්වත ඡායාව - ඇදගත් - මේ නොගැඹුරු - බොර දියර" (**එම. 307**)., " ඒකඝන පර්වතය - නෙක දිසා සරන කල" (**එම. 313**)., "රස පොළොව - බදාගත් - මහා කඳු - අතරෙහි" (**එම. 320**)., "ඒ අඳුරු - ගිර මතින් - පහළ - පර්වත වෙතට" (**එම. 326**)., "ගිරි ගුහාවෙහි නොරැඳී - සඳ දියරින් මෙළෙක් වුණ" (**එම. 327**)., "මහ කන්දේ - නිවැරැදි නම - සොයා ගියෙමි - සතර දෙසට" (**එම. 330**)., "පුංචි කඳුවල - ගොළු නිහඬ - මුහුණුවර" (**එම. 335**)., "උස් මුදුන් ගැන ම වනමින් - කුළු මුදුන් මහත් බැතියෙන්" (**එම. 340**)., "නොඉඳුල් ම මුදුනකැ යි - පෙර එක් පොතක දුටු - ගිර සොයා නැඟුණු කල" (**එම. 341**)., "සැදුණු ගල් ගිරි මතෙහි - දැඩි නිහඬ තරගයෙකි - කඳු මුදුන් වලාකුළු - වැලැඳ පිළිසඳරකිනි" (**එම. 342**)., "කඳු බඳින් නැඟි - මීදුම් කන්ද ම වසන අන්දම්" (**එම. 348**)., "නොඑක වන ගිරි නදී ජයගෙන - අට දිසා වෙත ඇදෙන අට දෙන" (**එම. 349**). යන මේවා ඒ අතර වෙයි.

'**පස්වණක් කවි ලකුණු**' නමැති කෘති එකතුවෙහි 'රිය කරා ගමන' නමැති පද්‍ය සංග්‍රහයේ ද එවන් යෙදුම් රාශියක් දැක ගත හැකි ය.

"නිහැඬියාවෙහි මත් ව හුන් කඳු සොලවමින් හදිසියේ පැන නැඟි" (**වීරසිංහ, 2011B:357**), "පර්වත මුදුනත දෙවොලට" (**එම. 357**)., "පෙර මා දැන හැඳිනි ගිරි හිස්... ඒ මායා කඳු පෙදෙස් සොයා ගෙන..." (**එම. 371**)., "ගෙපැල පිටුපස ගොඩැල්ලෙහි - ගල්තලාවෙහි වැතිරි" (**එම. 374**)., "නො ඇසෙ ද කඳු අතර දිය උල්පත් හඬන" (**එම. 382**)., "මින් පෙරාතු ව නො පැමිණි - දුර්ග පෙදෙසකට පිවිස... ඒ ශුද්ධ යැයි කියන පර්වතය" (**එම. 383**)., "මහා කඳු වැටිය ම... දෙකඳු එක් වන ඇඳිරි කඳුරෙක" (**එම. 391-92**)., "ගිරි සිරක් වැවේ දිය කැටපතෙහි පෙනී" (**එම. 396**)., "කඳු පෙළක් ගිනි ගනී ඇතෙක" (**එම. 406**)., " අවරගිරි නැටියෙන් වැටෙන" (**එම. 408**)., "ප්‍රපාතය වෙත එකලා ව - එළැඹුණෙ ද? නිසංසල ප්‍රපාතය වෙත - රහසේ ම බැස ගිය" (**එම. 412**)., "මෑත වන, ගිරි, නිම්න එහි වන... මහත් පර්වත භ්‍රාන්ත ව ගොස් - හිම මුදුන් සේ වැගිර යයි එහි" (**එම. 413**)., "කඳුකරෙන් එන නිදහස්... ගිරි හිස් වලා විදුලිය..." (**එම. 419**)., "සොහොන් කඳු වට සරති - උස් මුදුන් පීරා" (**එම. 424**). යනු ඒවා ය.

'**තුන්පෙති හතර පස් පෙති**' නම් ග්‍රන්ථයෙහි ස්ථාන රැසක ද කඳු පර්වත ගැන සඳහන් වෙයි.

"ඒ අප නැඟි මුදුන" (**වීරසිංහ හා රණවීර, 2014:63**), "කන්ද උස වුණත්" (**එම. 81**)., "සිය මුදුන සමතල කළ - උස ම උස කඳු ප්‍රාන්තය - නමදිමි ශුද්ධ වූ ගිරග මත සිට" (**එම. 83**)., "තවත් කන්දක් - තරණයට පෙර" (**එම. 86**)., "පෙන්නයි ගිරි දුර්ග වන දුර්ග" (**එම. 88**)., "මහ ගිරත් කියා" (**එම. 96**)., "කඳු අතර නිසලතාවෙහි" (**එම. 112**)., "සරමින් සොහොන් කඳු අතර" (**එම. 132**)., "දුර ඉමෙක මතු කරන - කඳු නිලක්" (**එම. 169**)., "උස ම කඳුවැටිය මත" (**එම. 172**)., "කඳු මුදුනත පළඟ බැඳ" (**එම. 210**). යනු එබඳු උදාහරණ ය.

'**චන්ද්‍ර බිම්බ**' නම් පද්‍ය සංග්‍රහයෙහි එන එවන් ස්ථාන කිහිපයක් මෙසේ උපුටා දැක්විය හැකි ය.

"නිගල් කන්දට උඩින් සඳවත" (**වීරසිංහ, 2005:13**), "තනි ගන පව්ව අහසෙහි" (**එම. 16**)., "කඳු අසබඩ හිඳින මිනිසුන් හට කියමි - කඳු ගැන ඔබ වදනක් දොඩනු නො ඇසිමි - කඳු මත හිඳින මිනිසුන් ගැන පුදුම වෙමි" (**එම. 17**)., "කඳුවල අසිරි පවසන් වදන් නැතියෙන... අඳවුන් විලස නො ව කඳු පහස ලබමින" (**එම. 17**)., "රැඳු ගල් කුළු නැගී" (**එම. 20**)., "සරස් වී නැගුණු ගල් කුළු හැම" (**එම. 20**)., "එමහත් හිම මුදුන වෙත ගමනට පැහැද... හිලරි මුදුන සිට පවසන'යුරු ඇසෙන" (**එම. 27**)., "මහත් කඳු රැළි අතර නො මැකී - නැගෙන එක් ගිරි කුළක රුව ඇති... එකඳුබද නිම්නයෙහි ගලනා" (**එම. 30**)., "මහ ගල් කුළ ඔබ - සදා මිහිමත පිහිටත්වා!" (**එම. 37**)., "මහත් පර්වත බිත්තිය" (**එම. 37**)., "එකෙක පරයා නැගුණු - අබිමන් කඳු පවුරු" (**එම. 39**)., "එක් ගිරක් නැත - ගන'ඳුරින් මතු ව මඳකට" (**එම. 39**)., "කඳු මුදුන නවාතැන් පොළෙහි" (**එම. 49**)., "නගන උස් තුටු රැව් - කඳු පාමුලින් පැමිණේ" (**එම. 49**)., "කඳු මුදුනක - නුදුරු ගිරි පියසෙක සිට" (**එම. 52**)., "තිරසර ව නැගේ - ගල් කන්දෙහි!" (**එම. 55**). යනු එවන් නිදසුන් ය.

'**ක්ෂණ නියාම**' කාව්‍ය සංග්‍රහයෙහි ද මේ ලක්ෂණය දක්නට ලැබේ. මේ එබඳු තැන් කිහිපයක්

"මැත උස් කුටයෙක" (**වීරසිංහ, 2019:13**), "ඉන් මිදී කුළ අග නැවැතුණු" (**එම. 14**)., "කුළු මුදුන් පෙදෙසට... පර්වත අඩවියට... වන දුදුළු ගල් කුළු ඇසුරු කොට... මහත් පවු මුදුන් වෙතට ය" (**එම. 15-16**)., "ගිරි පෙදෙසෙහි - මගේ තනි නිවහනට" (**එම. 27**)., "ගිරි ළැහැබ්වල සරන - මේ කුළු එතුණු පවුවෙක" (**එම. 29**)., "වාඩියේ කඳුවැටිය... නගර සිතුවම සොයා දිනයෙක - කඳු මුදුන නැග බැලුවෙමි - අවට හිස් කඳු එසැවී" (**එම. 34-35**)., "අනන්ත කඳු පවුරු" (**එම. 39**)., "පවු කුළ වෙතට නැග බැස යත එත උරණ... කුළ මත රහස දුටුවෝ නිසි මග ගොසින" (**එම. 46**), "එගොඩ හිස් කඳුවැටිවල" (**එම. 49**), "ගිරි මුදුන් පානා විට... "ඕවා මොන කඳු ද - එහේ නේ කඳු තියෙන්නෙ"යි - හාත්පස මිටි කඳු කොඳුරන" (**එම. 60**)., "ඈත කඳු ඇසුරෙහි" (**එම. 64**), "ගල් කුළු පවා පෙළා හැසිරෙන... ගිරි පවුරු පාරා" (**එම. 73-74**)., "වන දුර්ගය ගෙවා පැමිණ - මුදුන් කුළට නැඟි ඇඳුරිඳු... මේ කඳු වන තැනි බෑවුම්" (**එම. 76**)., "වැසී ගොස් ගිරි දුදුළු මැද" (**එම. 83**).,

"උදාගිරි මුදුන දිදුලයි රයක් ගෙවාහැර" (එම. 88). යනුවෙන් දැක්විය හැකි ය. කඳු පර්වත පාදක කොට ගෙන ඔහු විසින් නිර්මිත විවිධ වූ කාව්‍ය සංකල්පනා වෙන ම ශාස්ත්‍රීය ලිපියකට තරම් වන හෙයින් මෙහි ලා පූර්ණ විවරණයකට ඉඩ හසර වෙන් නො කෙරේ.

## නිගමනය

මෙලෙස නන්දන වීරසිංහයන්ගේ සමස්ත කාව්‍යාවලිය දෙස විමර්ශනාක්ෂිය යොමු කරන විට පෙනී යනුයේ ක්‍රමයෙන් උන්නතියට හා උත්කර්ෂයට ගිය ප්‍රතිභාපූර්ණත්වයෙන් සමලංකෘත කාව්‍යශෝභාවක් පවතින බව යි. විටෙක සරල සුගමභාවයේ ද තවත් විටෙක තත්සම බහුල ඕජෝගුණ සම්පන්න භාෂා ව්‍යවහාරයේ ද ස්පර්ශය ලබන අප කිවිවරයාණෝ අවිදග්ධ පාඨකයා මෙන් ම විදග්ධ පාඨකයා ද එක සේ තම ග්‍රහණයෙහි රඳවා ගනිති. උපමාවෙන් නො ව රූපකයෙන් මෙතරම් වැඩ ගත් කවියකු මෑත අවධියෙහි පහළ වී දැයි යන්න ද සැක සහිත ය. කියයුත්ත නිර්මාණාත්මක ව, සුනිශිත ව හා නොබිය ව කීමෙහි ලා නන්දනයන් පෑ එඩිය සිරි ගුනසිංහයන් වෙතින් හා පරාක්‍රම කොඩිතුවක්කු සූරීන් වෙතින් විනා අන්‍යයකුගෙන් හෙළයට හෙළි වූ අයුරක් මාගේ මතකයට නම් නො නැඟේ. '**ගිංගඟේ විලාපය**' පද්‍ය සංග්‍රහයෙන් ඇරඹී '**ක්ෂණ නියාම**' කාව්‍ය සංග්‍රහයෙන් උත්තුංගත්වයට හා සමුත්කර්ෂයට පත් සැබෑ දේශජ කවිත්වයේ රුවගුණ හා සුවඳ නන්දනයන්ගේ කව් පොකුරක ගැබ් වන්නේ ම ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. වීරසිංහ, එන්. (1984). *ගිංගඟේ විලාපය*. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
2. වීරසිංහ, එන්. (2005). *චන්ද්‍ර බිම්බ*. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
3. වීරසිංහ, එන්. (2011A). *සහස් රැස් යට*. කොළඹ: ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.
4. වීරසිංහ, එන්. (2011B)*. *පස්වණක් කවි ලකුණු*. කොළඹ: ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.
5. වීරසිංහ, එන්. සහ රණවීර, ඒ. (2014). *තුන්පෙති හතර පස්පෙති*. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

6. වීරසිංහ, එන්. (2018). *ක්ෂණ නියාම.* කොළඹ: ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.

*(**'පස්වණක් කවි ලකුණු'** නමැති සංග්‍රහයෙහි අන්තර්ගත පද්‍ය ග්‍රන්ථ - කිරි සුවඳැති රාත්‍රියක් - 1990, සත්‍යකාම නම් වෙමි - 1994, ගිරග - 1997, මහත් සඳ පිති බිඳෙක - 2001, රය කරා ගමන - 2009.)